02

Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities
2018, Vol. 7 (II) 13-28pp
© The Author 2018
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# වාණිජ ආර්ථිකයට පදනම සකස් කළ බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය හා 1840 ඉඩම් පනත

ආචාර්ය ජේ.කේ.ඒ. කාන්ති[1]

## Abstract

In 1796 the coastal area of Sri Lanka were surrendered to the British. In 1815 it became a British colony. The end of the war in Europe the colonial office quite understandably placed greater emphasis on the reduction of military expenditure. According to the Colebrook reform he recommended to reduction colony expenditure. The British rulers wanted to establish export based economy in Sri Lanka. They introduced several land ordinances. Ordinance No.12 of 1840, To Prevent Encrochments upon Crown Lands among them was the first one.

**Key Words:** British colony, British rulers, Export based economy,

## හැඳින්වීම

ක්‍රි.ව. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය අත්පත් කරගන්නා අවස්ථාව වන විට බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට එහි තිබූ වාණිජමය වටිනාකම සහ එය යුද්ධෝපක්‍රම අතින් වැදගත්

[1] *Senior Lecturer in History, Department of History and Archaeology, University of Ruhuna, Matara.* *jkajayasinghe@yahoo.com* *+94 718022262*

මධ්‍යස්ථානයක පිහිටා තිබීම හේතුවිය. මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉතා කෙටි කාලයකදීම උඩරට ප්‍රදේශ අත්පත් කර ගැනීම කෙරෙහි ඔවුහු අවධානය යොමු කළහ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පැවති අනාරක්ෂිත බව අවම කර ගැනීම, දේශසීමාවන් මුර කිරීමේ වියදම අඩුකර ගැනීම, ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා බටහිර දිසාවන්හි පිහිටා තිබූ බ්‍රිතාන්‍යයන් සතු ප්‍රදේශ සම්බන්ධ කෙරෙන ගොඩබිම් මාර්ගයක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාව වැනි කරුණු උඩරට අත්පත් කර ගැනීම කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට හේතු විය. ඒ අනුව 1815 දී උපක්‍රමශීලීව උඩරට අත්පත් කර ගත් බ්‍රිතාන්‍යයෝ එම වසරේ මාර්තු මාසයේ අත්සන් කළ උඩරට ගිවිසුම මගින් සමස්ත දිවයිනම තම අණසකට නතු කර ගත්හ.

1815 වන විට යුරෝපා බල ව්‍යාප්තිය තුළද බ්‍රිතාන්‍යය මුල්තැන හිමි කර ගෙන තිබිණි. ආසියාවේ ප්‍රධාන බලවතා බවට පත්ව සිටි ඔවුන්ට එරෙහි විය හැකි ප්‍රබල බලවේගයක්ද මේ වන විට නොතිබුණි. මෙබඳු තත්වයක් තුළ ඔවුන්ට තව දුරටත් ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වැදගත්කම අඩු විය. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් අනතුරුව ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් එය සුරක්ෂිත කරගැනීම කෙරෙහි අවධානය යොමු කළා විනා වාණිජමය වටිනාකම කෙරෙහි සැලකිලිමත්වීමට අවස්ථාවක් නොලැබිණි. මෙම තත්වය තුළ ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය වියදම් පවා දැරීමට බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරයට සිදු විය. ආරක්ෂක මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත් වූ අවධියේ මෙම තත්වය පිළිබඳව තැකීමක් නොකළ ද තව දුරටත් ශ්‍රී ලංකාව පාඩු ලබන යටත් විජිතයක් ලෙස පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයේ ඇතැම් නිදහස් මතධාරීහු ප්‍රශ්න කරන්නට වූහ. එහෙයින් මෙම තත්වය නොතකා හැර කටයුතු කිරීමට බ්‍රිතාන්‍ය රජයට නොහැකි විය.

### පර්යේෂණ ගැටළුව

දේශීය කෘෂිකර්මාන්තය නොතකා වාණිජ ආර්ථිකයක් නිර්මාණය කිරීමේ දී බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය ඉවහල් වූයේ කෙසේ ද යන්න ? මෙහි පර්යේෂණ ගැටලුව වේ.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම මෙම පර්යේෂණය සම්පූර්ණයෙන්ම ලිඛිත මූලාශ්‍රය මත පදනම් වූවකි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මේ සඳහා භාවිත කෙරිණි. ඉඩම් පනත් (Land Ordinances) කච්චේරි වාර්තා, (Kachchari Reports) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා (Census and Statistical Reports) බ්‍රිතාන්‍ය පාලනයට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් තම රාජකාරි පිළිබඳව සටහන් තබන ලද දින පොත්, බ්‍රිතාන්‍යයේ යටත් විජිත භාර රාජ්‍ය ලේකම් සහ මෙරට සිටි ආණ්ඩුකාරවරයා අතර හුවමාරු කර ගත් ලිපි ලේඛන (Despatches) පාලන වාර්තා (Administration Reports) නිල් පොත (Blue Book) සන්නස්, තුඩපත්, සීට්ටු පරිශීලනය ඉතා වැදගත් විය. රාජ්‍ය ලේඛනාගාරය - කොළඹ, මහනුවර, ජාතික කෞතුකාගාරය, ඉඩම් කච්චේරි- මහනුවර, ගාල්ල, බදුල්ල, ජාතික පුස්තකාලය - කොළඹ පේරාදෙණිය හා විශ්වවිද්‍යාලයීය රුහුණ විශ්වවිද්‍යාලයීය පුස්තකාල දත්ත ලබා ගත් ස්ථාන වේ.

## සන්දර්භය

ශ්‍රී ලංකාවේ උද්ගතවී ඇති දුර්වල ආර්ථික තත්ත්වයට හේතු සහ ඒවාට පිළියම් සෙවීම සඳහා පරීක්ෂා කොට නිර්දේශ ඉදිරි පත් කිරීමේ කාර්යය ඒ වනවිට කේප් කොලනිය සහ මුරුෂියස් දිවයිනේ කටයුතු කරමින් සිටි රාජකීය විමර්ශන කොමිසමට පවරන ලදී. විලියම් කෝල්බෘක් ගේ ප්‍රධානත්වයෙන් පත් කළ මෙම කොමිසම ඔහුගේ නමින් කෝල්බෘක් කොමිසම ලෙස හඳුන්වනු ලැබේ. තිදෙනෙකු ගෙන් සමන්විත මෙම කමිටුවේ අනෙක් සාමාජිකයන් දෙදෙනාට අසනීප තත්වය නිසා මෙරටට පැමිණීමට නොහැකි වූ බැවින් 1829 දී විලියම් කෝල්බෘක් පමණක් පැමිණියේය. පසුව ඔහුගේ සහායට චාල්ස් හේ කැමරන්ද පත්කර එවනු ලැබීය. වෘත්තියෙන් හමුදා නිලධාරියෙකු වූ කෝල්බෘක් ආර්ථික විද්‍යාඥයෙක්ද විය. එමෙන්ම එවකට බ්‍රිතාන්‍යයේ ප්‍රචලිතව පැවති ලිබරල්වාදී හා රාජ්‍ය නිර්බාධවාදී අදහස් ගරු කළ පුද්ගලයෙකි. අධිනීතිඥයෙකු වූ කැමරන් ප්‍රකට බෙන්තම්වාදියෙක් විය.

ශ්‍රී ලංකාවට පැමිණි කෝල්බෲක් කොමිසමට තම පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යාම එතරම් පහසු කටයුත්තක් නොවීය. පරීක්ෂණ කොමිසමක් පත් කිරීමට එකඟ නොවූ බාන්ස් ආණ්ඩුකාරවරයාගේ සහයෝගය මෙම කොමිසමට නොලැබිණි. මෙරට භාෂා ව්‍යවහාරය සහ සිරිත් විරිත් පිළිබඳ අවබෝධයක් නොතිබීම නිසා විවිධ ගැටලුවලට මුහුණ පෑමට කෝල්බෲක් කොමිසමට සිදු විය. කෙසේ වුවද කොමිසම මෙරට සම්බන්ධයෙන් වාර්තා 5ක් සකස් කොට යටත්විජිත කාර්යාලයට ඉදිරිපත් කරන ලදී. ප්‍රශ්නාවලියක් මගින් රජයේ නිලධාරින්ගෙන්ද, රටේ ඉහළ පෙළේ දේශීය හා විදේශීය පුද්ගලයන්ගෙන්ද ලබාගත් තොරතුරු, පෙත්සම් මගින් ලබාගත් තොරතුරු සහ රටතුළ සංචාරය කිරීමෙන් තමන් ලද තොරතුරු ආදිය පදනම් කරගෙන එකී වාර්තා සකස් කෙරිණ. රාජ්‍ය පරිපාලනය පිළිබඳ වාර්තාව (1831.12.24), ශ්‍රී ලංකාවේ ආදායම් වියදම් පිළිබඳ වාර්තාව (1832. 01. 31), අධිකරණයේ ස්වභාවය හා එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ වාර්තාව (1832. 01. 31), රාජකාරි ක්‍රමය පිළිබඳ රහස්‍ය වාර්තාව (1832.03.16), ආයතන අය වැය පිළිබඳ වාර්තාව (1832.05. 28). එසේ සකස් කරන ලද වාර්තා වේ (Mendis, 9-212). මෙම වාර්තා පහෙන් අධිකරණය හා සම්බන්ධ වාර්තාව කැමරන් විසින් සකස් කළ අතර අනෙක් සියලු වාර්තා කෝල්බෲක් විසින් සකස් කරන ලදී.

කෝල්බෲක් කොමිසමේ සංශෝධන වඩා පුළුල් ලෙස ගෙන බලන විට එමගින් ඇති කිරීමට බලාපොරොත්තු වූ අරමුණු කිහිපයක් හඳුනාගත හැකිය. ඔහු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරි පත් කළ සෑම වාර්තාවකින්ම එවකට පැවති ක්‍රමයේ අඩුපාඩු පෙන්වාදී ඇති අතර එම අඩුපාඩුවලට පිළියම් සඳහා අනුගමනය කළ යුතු අළුත් ක්‍රමද යෝජනා කළේය. උඩරට හා පහතරට වශයෙන් එතෙක් පැවති බෙදීම නැති කොට ශ්‍රී ලංකාව පළාත් පහකට බෙදා පරිපාලනය ඒකාබද්ධ කිරීම, මෙරට ආණ්ඩුක්‍රම විකාශය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළ ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම, ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම සහ ඉංග්‍රීසි පන්නයේ නව උසාවි පද්ධතියක් හඳුන්වාම වැනි කරුණු ඒ අතර විය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය අතින් බැලූවිට වඩා වැදගත් වන්නේ කෝල්බෲක් විසින් ඉදිරිපත් කරන ලද ආර්ථික සංශෝධන පිළිබඳ යෝජනාය.

කෙටිකාලීනව ප්‍රතිඵල ලබාගත හැකි (වියදම් අඩුකිරීම) යෝජනා සහ දීර්ඝකාලීන ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා වූ යෝජනා වශයෙන් නිර්දේශ කොටස් දෙකක් වේ. එංගලන්තයේ ඒ වන විට ප්‍රචලිත වෙමින් පැවති ධනවාදී ආර්ථික ක්‍රමය කෙරෙහි විශ්වාසයක් මෙන්ම ඒ සඳහා කැමැත්තක් දැක්වූ පුද්ගලයෙකු වශයෙන් එබඳු ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළද නිර්මාණය කිරීමට හැකිවන ආකාරයට කෝල්බෘක් තම යෝජනා ඉදිරිපත් කළේය. එබඳු ක්‍රමයක් ස්ථාපිත කිරීමේදී ඒ සඳහා පැවති ප්‍රධාන බාධකයක් වූ රජයේ වෙළඳ ඒකාධිකාරය ඔහු දැඩිව විවේචනය කර ඇත. කුරුඳු, ලුණු, සහ අරක්කු වැනි විදේශීය වෙළඳාමෙන් ලාභ ලැබිය හැකි ද්‍රව්‍ය රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවතීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය නොවීමට බලපා ඇති ප්‍රධාන හේතුව බව කෝල්බෘක්ගේ අදහස විය. ශ්‍රී ලංකාවේ ඒ වන විට පැවති හේන් වගාව ඇතුළු දේශීය ගොවිතැන් කටයුතු කෝල්බෘක්ගේ දැඩි අවධානයට ලක්විය. දිවයිනේ ආදායම් ක්‍රම ගැන සඳහන් කළ ඔහු එබඳු ආදායම් මාර්ග 14ක් පමණ මෙරට ඇති බව පෙන්වා දී ඇත. (G.C. Mendis, *Vol.* I 1933:79) එම ආදායම් ක්‍රම කාලයට නොගැළපෙන බව පවසා එවැනි ආදායම් මාර්ග ඉවත් කිරීම හෝ වෙනස් කිරීම කළ යුතුය යන්න ඔහුගේ නිර්දේශය විය. රාජ්‍ය ඒකාධිකාරය ඉවත් කොට සෘජු බදු වෙනුවට වක්‍ර බදු පැනවිය යුතුය යන්න කෝල්බෘක්ගේ එක් යෝජනාවකි. ප්‍රධාන වශයෙන් කුරුඳු හා ලුණු ඒකාධිකාරය අවලංගු කළ යුතු බවද, ඉඩම්, මාළු, සහ මත්පැන් සම්බන්ධයෙන් පැවති සෘජු බදු වෙනුවට වක්‍ර බදු අයකළ යුතු බවද, රජයේ තීරු බදු ඉවත් කළ යුතු බවද කෝල්බෘක් නිර්දේශ කළේය. (ibid 79- 82) එසේ වුවද හදිසියේම තීරු බදු අවලංගු කළ හොත් එය රජයේ ආදායම කෙරෙහි ඉතා අහිතකර බලපෑම් ඇති කිරීමට ඉඩ ඇති බැවින් එය ක්‍රමිකව සිදු කළ යුතු බවද නිර්දේශ කොට ඇත.

බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය සකස්වීම කෙරෙහි බෙහෙවින් බලපෑ ඉඩම් බදු අයකිරීම කෙරෙහි කෝල්බෘක් ගේ විශේෂ අවධානය යොමු විය. දේශීය ඉඩම් භුක්ති ක්‍රමයේ එක් අංශයක් ලෙස රජයට සපයනු ලබන සේවා වෙනුවෙන් ඉඩම් ලබා දීම **ඉඩම් භුක්ති රාජකාරී ක්‍රමය** නොර්ත් ආණ්ඩුකාරයා විසින් අවලංගු කොට ඒ වෙනුවට මුදලින් වැටුපක් ගෙවීමටද ඉඩම් භුක්ති විඳීම වෙනුවෙන් ඉඩම් බද්දක් අය කිරීමටද අවශ්‍ය පියවර ගෙන තිබිණි. නමුත්

මෙම ඉඩම් බද්ද රටේ සෑම ප්‍රදේශයකටම සමාන වූවක් නොවීය. යාපනය ප්‍රදේශයේ දී අස්වැන්නෙන් 1/10ක් බදු වශයෙන් ගෙවිය යුතු වූ අතර සෙසු ප්‍රදේශවලදී ඒ ඒ ඉඩමේ සරුසාරත්වය මත අය කළ යුතු බදු ප්‍රමාණය තීරණය කරනු ලැබිණ. බදු අයකිරීමේ අයිතිය වෙන්දේසියේ විකිණූ අතර ඒවා එකතු කිරීමේදීද නොයෙක් ආකාරයේ ගැටලු පැන නැගුණි (සෝමරත්න, පී.පී.වී, 1991: 245). මෙවැනි බදු අයකිරීම් ජනතාවට හිංසාකාරී බවත්, රටේ සංවර්ධනයට බාධාවක් බවත් පැවසූ කෝල්බෲක්ගේ අදහස වූයේ රටේ සියලු ඉඩම් බද්දෙන් නිදහස් කළ යුතු බවයි. රජයේ ප්‍රධාන අදායම් මාර්ගයක් වූ කුරුඳු සම්බන්ධයෙන් පැවති රාජ්‍ය ඒකාධිකාරයද අහෝසි කොට ඉඩම් බදුද අහෝසි කළ හොත් රජයේ ආදායම් අඩුවන බැවින් එයට විසඳුමක් වශයෙන් සෑම ඉඩමකින්ම සැමදාම එක සමාන බද්දක් අය කළ යුතු බවද එය මුදලින් ගෙවිය යුතු වූ බවද, කොටස් වශයෙන් ගෙවීමට ඉඩකඩ සලසා දිය යුතු බවද නිර්දේශ කෙරිණ (සෝමරත්න, පී.පී.වී, 1991: 245).

කෝල්බෲක් නිර්දේශ සියල්ලෙහිම අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ වියදම් අඩුකර ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා ගැළපෙන ආර්ථික ක්‍රමයක් හඳුන්වා දීමයි. ධනවාදී ආර්ථික ක්‍රමය කෙරෙහි විශ්වාසයක් පැවති පුද්ගලයකු වශයෙන් ඔහු එම ක්‍රමය ශ්‍රී ලංකාව තුළද ප්‍රචලිත කළ හැකි ආකාරයට මූල සම්පත් නිදහසේ ලබා ගැනීමට ඉඩ සැලසෙන ආකාරයේ නිර්දේශ ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇති බව පැහැදිලිය. එම මූල සම්පත් වූයේ ශ්‍රමය, භූමිය, සහ ප්‍රාග්ධනයයි. භූමිය සහ ශ්‍රමය ශ්‍රී ලංකාවේ සුලභ වුවද එවැනි ප්‍රාග්ධනයක් යෙදවිය හැකි ව්‍යවසායකයන් පිරිසක් ශ්‍රී ලංකාවෙන් සොයා ගැනීම ඉතා අපහසු කාර්යයක් විය. එබැවින් එබඳු ආර්ථික සංවර්ධනයක් උදෙසා ධනය ආයෝජනය කළ හැකි ප්‍රාග්ධන හිමියන් ලෙස යුරෝපීයයන් පිරිසක් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් විය. ශ්‍රී ලංකාවේ ඉඩම් යුරෝපීයයන්ට අත්පත් කරගත හැකි ආකරයට මෙරට ඉඩම් ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම ඒ සඳහා අනුගමනය කළ යුතු එක් පියවරක් බව කොමිසමේ නිර්දේශය විය.

කෝල්බෲක් කොමිසම මගින් හඳුන්වා දෙනු ලැබූ නව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට පැවති මූලික බාධාවක් ලෙස බ්‍රිතාන්‍ය පාලකයන් හඳුනාගනු

ලැබුවේ මෙරට ක්‍රියාත්මක වෙමින් පැවති දේශීය ඉඩම් ප්‍රතිපත්තියයි. මෙම ක්‍රමය යටතේ වගා කිරීම සඳහා ඉඩම් අවශ්‍ය පුද්ගලයන්ට රජුගෙන් නොමිලේ ඉඩම් ලබා ගත හැකි විය. එසේ ලබා ගත හැකි වූයේ ඉඩම් සුළු ප්‍රමාණයක් පමණි. එහෙත් ලාභ උපයන ව්‍යාපාර ලෙස මුදල් ආයෝජනය කිරීමේදී එබඳු සුළු ඉඩම් කට්ටි පමණක් ප්‍රමාණවත් නොවීය. මුදලට ඉඩම් විකිණීමක් මෙකල සිදු නොවීය. ඉඩම් වගා කොට ලබා ගන්නා අස්වැන්නෙන් රජය මගින් නියම කොට ඇති ප්‍රමාණය බදු වශයෙන් ගෙවීමට වගාකරුවා බැඳී සිටියේය. එබැවින් මෙම ක්‍රමය යටතේ ඉඩම් වගා කිරීම සඳහා මුදල් ආයෝජනය කිරීමට යුරෝපීයයන් එකඟ නොවන බව පෙන්වා දුන් කොමිසම මුදලට ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කළ යුතු බව යෝජනා කරන ලදී.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ස්වයංපෝෂිත ආර්ථික රටාව බ්‍රිතාන්‍යයන් බලාපොරොත්තු වූ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී පැවති ප්‍රබල බාධාවක් විය. ශ්‍රී ලංකාවේ එතෙක් වගා කළ ආහාර භෝග වෙනුවට ජාත්‍යන්තර වෙළඳ පොළෙහි අලෙවිකර උපරිම ලාභ ලැබිය හැකි වාණිජ භෝග වගා කිරීම ඔවුන්ගේ අපේක්ෂාව විය. මේ වන විට ලෝක වෙළඳ පොලෙහි වැඩි ඉල්ලුමක් පැවති කෝපි වගාව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට බ්‍රිතාන්‍යයන් ගේ අවධානය යොමු වුවද ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය එයට බාධාවක් විය. එබැවින් ඉතා ඉක්මනින් මෙම දේශීය ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට බ්‍රිතාන්‍යයෝ පාලකයෝ ක්‍රියාත්මක වූහ.

කෝපි වගාව ව්‍යාප්ත කිරීමේදී බ්‍රිතාන්‍යයන්ට මුහුණ දීමට සිදු වූ ප්‍රධානම ගැටලුව වූයේ ඒ සඳහා ප්‍රමාණවත් ඉඩම් ලබා ගත නොහැකිවීමයි. වතුවගාවට වඩාත් උචිත වූ උඩරට ප්‍රදේශයේ පැවති ඉඩම් බොහොමයක් ස්වදේශිකයන් විසින් තම ගොවිතැන් කටයුතු සඳහා යොදා ගෙන තිබිණ. තවත් ඉඩම් ප්‍රමාණයක් ඔවුන්ගේ ගව මහීෂාදීන්ට තණ කොළ කැවීම සඳහා යොදා ගෙන තිබිණ. උඩරට ක්‍රියාත්මක වූ ඉඩම් භුක්ති ක්‍රමය අනුව වගා නොකළ හෝ පදිංචි නොවූ හෝ ඉඩම් රජයට අයත් ඉඩම් සේ සැලකු අතර රජය විසින් තහංචි කැලේ (රක්ෂිත වනාන්තර) ලෙස නම් නොකළ ඕනෑම ඉඩමක් වගා කිරීමට ජනතාවට අයිතිය තිබිණ. ඔවුහු ඒවායේ සින්නක්කර අයිතියක්ද

බලාපොරොත්තු නොවූහ. තම ජීවනෝපාය උපයා ගැනීම සඳහා එක් කන්නයක් හැර කන්නයක් එම ඉඩම්වල හේන් වගාකොට තම ජීවනෝපාය සලසා ගැනීම පමණක් ජනතාව බලාපොරොත්තු වූහ. හේන් වගාවේදී එකම ඉඩම වර්ෂයක් පාසා වගා නොකළ අතර වරක් වගා කළ ඉඩමේ පස සරුවීම සඳහා වසර කිහිපයක් වගා නොකොට මුඩු ඉඩම් බවට පත් වීමට ඉඩ හැරීම සාමාන්‍ය සම්ප්‍රදායානුකූල ක්‍රමය විය. ඒ නිසා උඩරට ප්‍රදේශවල ග්‍රාමීය ජනතාව විසින් ස්වකීය ඉඩම් ලෙස සලකා භුක්ති විඳින ලද එහෙත් වසර කිහිපයක් තිස්සේ මුඩු බිම් වශයෙන් තිබූ ඉඩම් කට්ටි විශාල ලෙස තිබිණි.

ක්‍රමානුකූලව වතු වගාව ව්‍යාප්ත කිරීම සඳහා මූලධනය ආයෝජනය කිරීමේදී බ්‍රිතාන්‍යයන් සතුව පැවතියේ මෙයට වඩා වෙනස් වූ අරමුණකි. දේපළවලට සම්පූර්ණ අයිතිය කියා පෑමටත්, ඒවා ස්ථිර ලෙස භුක්ති විඳීමටත්, තමන් කැමති අවස්ථාවක එම ඉඩම විකිණීමටත් එංගලන්තයේ ධනවාදී ආර්ථිකයකට හුරු පුරුදුවී සිටි බ්‍රිතාන්‍ය ව්‍යාපාරිකයෝ බලාපොරොත්තු වූහ. කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදී ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බ්‍රිතාන්‍ය රජය මගින් යුරෝපීයයන්ට ඉඩම් විකිණීම ආරම්භ කළ නමුත් දේශීය ගොවීහු තව දුරටත් එසේ විකුණන ලද ඉඩම්වලට ඇතුල්වී වගා කටයුතු කළ අතර ගවයන්ට තණ කැවීම ආදිය ද සුපුරුදු ලෙසම කරගෙන ගියහ. (අසෝකා බණ්ඩාරගේ, 2005 : 146) ඔවුන් මෙවැනි ක්‍රියා සිදු කරනු ලැබුවේ එක්කෝ යටත් විජිත රජයේ නීතිය පිළිබඳව නොදැන විය හැකිය. එසේ නැතිනම් යටත් විජිත රජයේ අණ පිළිගැනීමට පැවති අකැමැත්ත නිසා විය හැකිය. එම අරමුණ කුමක් වුවද තමන් එතෙක් භුක්ති විඳි ඉඩම් අහිමිවීමෙන් දේශීය ජනතාව දැඩි අපහසුතාවට පත්වූ බව පැහැදිලිය. අනෙක් අතට තමන් මිළදී ගත් ඉඩම නිදහසේ පරිහරණය කිරීමට නොහැකිවීම නිසා යුරෝපීය ව්‍යාපාරිකයෝද අපහසුතාවයට පත් වූහ. මෙබඳු තත්වයන් තුළ ඉඩම් මිළදී ගෙන මෙරට වගා කටයුතු කරගෙන යාමට යුරෝපීයයෝ මැලිකමක් දැක්වූහ.

එසේ වුවද වතු වගාව ශීඝ්‍රයෙන් ව්‍යාප්ත කළ යුතු අවධියක ව්‍යවසායකයන් මෙසේ අධෛර්යවත්වීම බ්‍රිතාන්‍ය රජයට විශාල පාඩුවක් විය. එබැවින් මෙම තත්වය මගහැර ගැනීම සඳහා ස්ථිර විසඳුම් සෙවීමට බ්‍රිතාන්‍ය රජයට සිදු විය.

එම අවශ්‍යතාව ඉටු කර ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය ධනවාදී ආර්ථික ක්‍රමයට ගැළපෙන ආකාරයෙන් සකස් කර ගැනීම සඳහා 19වන සියවසේ මුල් භාගයේ සිට 20වන සියවසේ මැද භාගය දක්වා ඔවුන් විසින් වරින් වර ඉඩම් පනත් කිහිපයක් හඳුන්වා දෙන ලදී. **රජයේ ඉඩම්වලට අනවසරයෙන් ඇතුල්වීම වැලැක්වීමේ 1840 අංක 12 දරණ ආඥා පනත (Ordinance No.12 of 1840, To Prevent Encrochments upon Crown Lands)** ඔවුන් විසින් හඳුන්වා දෙන ලද මුල්ම ඉඩම් පනත විය (The Legislative Enacments of Ceylon,Vol, I. : 1938,123-138). මුඩුබිම් සඳහා රජයට හා පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම් නිර්ණය කිරීමට අවශ්‍ය මිනුම් දඬු නියම කිරීම මෙම පනත පැනවීමේ අරමුණ විය. 1840 ඔක්තෝම්බර් මස 21වන දින පනවන ලද මෙම පනත යටතේ පුද්ගලික අයිතිය සනාථ කිරීම සඳහා උසාවිය පිළිගත් නීත්‍යනුකූල ලියවිළි නොමැති ඉඩම් සියල්ල රජයේ (කිරීටයට අයත්) ඉඩම් ලෙස සැලකූ අතර එබඳු ඉඩමක් පරිහරණය කිරීම කිරීටය සතු ඉඩමකට බලෙන් ඇතුල්වීමක් ලෙස සලකා ඒවා වැළැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන යොදන ලදී.

ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය තරම් ඉඩම් රජයෙන් නොමිළේ ලබා ගෙන පරිහරණය කිරීමට ජනතාවට අවස්ථාව සැලසී තිබිණි. එසේ වුවද ජනතාවට ඒවායේ අයිතිය පිළිබඳ කිසිදු ලේඛනයක් නොවීය. එනමුත් කිසිදු බාධාවකින් තොරව එම ඉඩම් භුක්ති විඳීමට එකල ජනතාවට නිදහස තිබිණි. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ගමක කිසියම් පවුලක් පුළුල් වීමේදී එහි සාමාජිකයන්ට වගා කිරීමට ලැබී තිබූ ඉඩම් කොටස ප්‍රමාණවත් නොවන අවස්ථාවල ගමට යාබදව තිබූ රජයේ ඉඩම් කැබැල්ලක් අස්වද්දාගෙන ගම පුළුල් කිරීමට ඉඩකඩ තිබිණි. එවැනි අවස්ථාවක ඉඩම අස්වැද්දූ පුද්ගලයා කළ යුතු වූයේ ගම්මුලාදෑනියාට දන්වා නියමිත බද්ද ගෙවීම පමණි. 1840 අංක12 දරණ ඉඩම් පනත හඳුන්වා දීමත් සමග එතෙක් ගොවි ජනතාව එපරිද්දෙන් නිදහසේ භුක්ති විඳි ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට ඔවුන්ට සිදුවිය. ශ්‍රී ලංකාවේ වතු වගාව ව්‍යාප්ත කිරීමේ කාර්යයේදී නිරවුල් ඔප්පු සහිතව ආයෝජකයන්ට අවශ්‍ය ඉඩම් ලබා දීම රජයට පැවරී තිබූ වගකීමක් විය. ඒ සඳහා රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් නිරවුල්ව හඳුනා ගැනීමට රජයට අවශ්‍ය විය. 1840 අංක12 දරණ ඉඩම්

පනත යටතේ පනවන ලද කොන්දේසි ලාංකික ගොවි ජනතාවට හිතකර නොවූ බව පැහැදිලිය. මෙම පනත මගින් සියලුම කැලෑ ඉඩම්, මුඩුබිම්, වගා නොකළ ඉඩම් සහ පදිංචියක් නැති සියලුම ඉඩම් රජයේ ඉඩම් වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. සියලුම හේන් ඉඩම් සහ වගා කොට කාලයක් පුරන්වීම සඳහා තබා ඇති ඉඩම් කිසිදු පුද්ගලයකුට පුද්ගලිකව අයිති නොවූ බැවින් ඒවාද එමගින් රජයේ ඉඩම් ලෙස සලකන ලදි (Clause 1 of Ordinance No.12of 1840) මේ අනුව තමන් භුක්ති විඳි ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට යම් පුද්ගලයකුට අවශ්‍ය වුවහොත් ඒ සඳහා උසාවියට පිළිගත හැකි නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් කිරීම අනිවාර්ය විය. එසේ අයිතිය තහවුරු කර නොගෙන ඉඩමක් භුක්ති විඳීමට හෝ එයට අයිතිවාසිකම් කියා පෑමට කිසිදු පුද්ගලයකුට නීත්‍යානුකූල අවසරයක් නොවීය. (Clause 1 of Ordinance No.12of 1840) කිසියම් පුද්ගලයෙකු එබඳු ඉඩමක් භුක්ති විඳින්නේ නම් ඔහුට එරෙහිව නඩු පැවරීමට අයිතිය පනතේ ප්‍රකාරව රජයට තිබිණි. එබඳු අවස්ථාවක අනවසරයෙන් ඇතුල් වූ බවට චෝදනා ලබන පුද්ගලයාට එරෙහිව සිතාසි නිකුත් කිරීමක් සිදුවේ. එසේ සිතාසි නිකුත් කොට දින 14ක් ඇතුළත නිශ්චල දේපළද සමගම ඉඩම රජයට බාර දිය යුතු විය. යම් පුද්ගලයෙක් ඉඩම භාර නොදී සිටිය හොත් ඔහු පවුම් 5ක දඩයකට යටත් කිරීමේ හෝ බරපතල වැඩ සහිතව හෝ රහිතව වසර පහකට සිරගත කිරීමේ බලයද මෙම පනත මගින් නීත්‍යානුකූල කර තිබිණ.

එසේම යම් පුද්ගලයෙකු සතුව ඉඩමේ අයිතිය තහවුරු කළහැකි ලිඛිත සාක්ෂි තිබේ නම් ඒවා උසාවියට ඉදිරිපත් කිරීමට ඉඩම් භුක්ති විඳින්නාට අවසර දී තිබිණි (Clause 1 of Ordinance No.12of 1840) දේශීය ඉඩම් අයිතිය හා භුක්ති ක්‍රමය අනුව රජු විසින් ප්‍රභූ මට්ටමේ නිලධාරීන්ට සහ විහාර දේවාලවලට ප්‍රදානය කළ ඉඩම් සන්නස්, තුඩපත් ආදිය මගින් පිරිනැමූ නමුත් සියලු ඉඩම් ප්‍රදානයන්ට එබඳු ලියවිල්ලක් හෝ නොවීය. එපමණක් ද නොව 1833 ක්‍රියාත්මක කළ අධිකරණ ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන ලද නව නීති හා උසාවි ක්‍රමය යටතේ සන්නස්, තුඩපත් වැනි ලේඛන නීත්‍යණුකූලව වලංගු ලේඛන ලෙස පිළිගැනීමක්ද සිදු නොවීය. ඒ අනුව ඉඩම් භුක්ති විඳිමින් සිටි දේශීයයන්ට පනතින් නියම කොට තිබූ පරිදි ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව ඔප්පු කිරීම ඉතාම අසීරු කාර්යයක් විය. පනතින් නියම කළ

පරිදි ඉඩමේ අයිතිය තහවුරු කිරීමට හැකි නීත්‍යානුකූල ලියවිලි හිමි අය වෙතොත් ඒ අය ඒවා උසාවියට ඉදිරිපත් කළ විට එම ලේඛන සලකා බලා ඒවා පිළිගත හැකියයි හැඟේ නම් පමණක් එහි අයිතිය තහවුරු කෙරෙන අතර ඒ සඳහා යම් කිසි ගෙවීමක් කිරීමටද ඉඩම භුක්ති විඳි පුද්ගලයාට නියම කෙරිණ. එසේ නොමැතිව දේශීය ක්‍රමය යටතේ ඉඩම් භුක්ති විඳිමින් සිටි අය තව දුරටත් ඒවා භුක්ති විඳිමින් සිටියහොත් එබඳු පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීමට උසාවියට බලතල පවරා තිබිණි (Clause 4 of Ordinance No.12of 1840).

වසර 30ක් හෝ ඊට වැඩි කාලයක් තිස්සේ කිසිදු බාධාවකින් තොරව රජය භුක්ති විඳි සියලු කුරුඳු ඉඩම් රජය සතු බව මෙම පනතින් ප්‍රකාශයට පත් කෙරිණි (Clause 5 of Ordinance No.12of 1840). කැලෑ ඉඩම්, මුඩු ඉඩම්, පදිංචි නොවූ ඉඩම්, සියලුම හේන් ඉඩම් මෙන්ම වගා කොට කාලයක් තිස්සේ අත්හැර දැමූ ඉඩම්, කවරාකාර හෝ අයිතියක් ඔප්පු කරන තෙක් රජයේ අයිතියට පත් කිරීමට නියම විය. උඩරට ප්‍රදේශය තුළ යම් පුද්ගලයෙකු සතුව ඉඩම්වල සීමාවන් හා මායිම් පිළිබඳව සෑහීමකට පත්විය හැකි සාක්ෂි සමග සන්නසකින් ලබා දුන් ඉඩම් තිබේ නම්, එමෙන්ම බදු ගෙවන ලද බව තහවුරු කළහැකි ලේඛන සහිත ඉඩම් තිබේ නම්, වසර 20ක් එම ඉඩම් භුක්ති විඳ තිබේ නම්, හා ඒවායේ නීත්‍යනුකූල අයිතිය ඔප්පු කළ හැකිනම් පමණක් එබඳු ඉඩම් පුද්ගලික අයිතිය ඇති ඉඩම් ලෙස පිළිගැනිණ (Clause 6 of Ordinance No.12of 1840).

මෙම පනත අනුව සෑම ඉඩම් භුක්ති විඳින්නෙකුටම තම ඉඩමේ නීත්‍යනුකූල අයිතිය තහවුරු කර ගැනීමට සිදු විය. රජයේ ඉඩමක් ලෙස ප්‍රකාශ කළ ඉඩමකට යම් පුද්ගලයකුට හිමිකම් තිබේ නම් ඒ බව දිසාපතිවරයාට දැනුම් දී ඔහු මගින් තම අයිතිය තහවුරු කර ගත යුතු විය. එම ඉඩම ලැබූ දිනය, ලැබුණ ආකාරය, ඉඩමේ මූලික සැලැස්මේ නම ආදි සියලු විස්තර දිසාපතිවරයාට ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් ඉක්බිතිව මිනුම් නිලධාරියකු විසින් ඒ පිළිබඳව පරීක්ෂණයක් කරනු ලැබිණ. එමගින් එම ඉඩම රජයට අයිති නොවන ඉඩමක් බවට තහවුරු වුවහොත් පමණක් එම ඉඩමට නැවත

නීත්‍යනුකූල ලියවිල්ලක් නිකුත් කරනු ලැබිණ. එම ලියවිල්ල නිකුත් කළ දා සිට එය ඕනෑම උසාවියක පිළිගත හැකි ලියවිල්ලක් බවට පත් වේ (Clause 7 of Ordinance No.12of 1840). උඩරට ප්‍රදේශයේ ඉඩම් පරිහරණය කළ ආකාරය අනුව සලකා බැලීමේදී මේ අන්දමින් තම ඉඩමේ අයිතිය තහවුරු කළ හැකි ඉඩම් පැවතියේ අතළොස්සක් පමණි. ඒ අනුව බහුතරයක් ගොවීන් තමන් එතෙක් වගා කළ හේන් ඉඩම්වලට සහ සතුන්ට තණ කැවීම ආදියට භාවිත කළ ඉඩම්වලට අයිතිය ඔප්පුකර ගැනීමට නොහැකිව අසරණ පිරිසක් බවට පත්වීම මෙම පනත තුළින් සිදුවීම වැළැක්විය නොහැකි විය. මෙතෙක් යම්කිසි පුද්ගලයෙකු කිසිදු ගෙවීමක් හෝ රජයේ ලැබීමක් හෝ නොමැතිව වසර 10කට නොඅඩු හෝ වසර 30කට නොවැඩි කාලයක් යම් ඉඩමක් භුක්ති විඳ තිබේ නම් එහි වටිනාකමෙන් භාගයක් ගෙවා එම ඉඩම හා නිශ්චල දේපලවල සම්පූර්ණ අයිතිය ඔහු සතු කර ගැනීමේ අවස්ථාව පනතින් ලබාදී තිබිණ (Clause 9 of Ordinance No.12of 1840).

බ්‍රිතාන්‍යයන් තම වතු වගාව සඳහා පාරවල් සකස් කිරීමේදී ඒ සඳහා පැවති බාධක ඉවත් කර ගැනීමේ උපාය මාර්ගද මෙම පනතට ඇතුළත් කර ඇති බව පැහැදිලිය (Clause 10 of Ordinance No.12of 1840). යම්කිසි පුද්ගලයෙක් පුළුල් පාරවල්වලට, අතුරු මාර්ගවලට, හෝ වෙනත් මහා මාර්ගවලට යම්කිසි වගාවකින් හෝ වෙනයම් දෙයකින් බාධා කර තිබේ නම් එවැනි ඉදිකිරීමක් හෝ බාධා කිරීමක් උසාවි නියෝගයකින් ඉවත් කිරීමට බලය ලබා දී තිබුණි. එමෙන්ම එවැනි අනවසර ඉදි කිරීම් පිළිබඳව එම ප්‍රදේශයේ ප්‍රධානියා වන ගම් මුලාදෑනියා විසින් ඉතා ඉක්මනින් රජයට දැනුම් දිය යුතුවිය. එසේ දැනුම් දීමට අසමත් වුවහොත් පවුම් 10කට නොවැඩි දඩයකට යටත්වීමට ඔහුට සිදු විය (Clause 11 of Ordinance No.12of 1840). ඒ නිසා දඩයෙන් බේරීම සඳහා කිසිදු විචාරයකින් තොරව ගම් මුලාදෑනීවරුන් දේශීය ගොවීයන්ගේ ගොවිබිම්වලට සහ වෙනත් ඉදිකිරීම් (නිවාස) වලට එරෙහිව රජයට දැනුම් දීම නිසාද ගොවි ජනතාව මහත් අසීරුතාවලට මුහුණ දුන්හ.

1840 අංක 12 දරණ ඉඩම් ආඥා පනත යටතේ පනවා තිබූ ඇතැම් කොන්දේසි නිසා ජනතාවට තම ඉඩම්වල අයිතිය කියාපෑම ඉතා අසීරු කරුණක් විය.

මේ තත්වය විශාල ප්‍රශ්නයක් විය හැකි බැවින් 1841 අගෝස්තු මස 11 වන දින පැවති විධායක සභාවේ නියෝගයක් මත 1841 අංක 09 දරණ පනත මගින් 1840 අංක 12 දරණ ඉඩම් පනතේ යම් කිසි වෙනසක් කිරීමට තීරණය කරන ලදී. 1840 අංක 12 දරණ පනතේ 9වෙනි වගන්තිය අවලංගු කිරීම සහ එහි ඇතැම් ප්‍රතිපාදන කිහිපයක් යළි බලගැන්වීම සඳහා වූ 1841 අංක 9 දරණ ආඥා පනත (Ordinance No. 9 of 1841-To Repeal the Ninth Clause of the Ordinance No. 12of 1840, and to Re- Enact Certain of its Provisions) හඳුන්වා දෙන ලදී. ඒ අනුව 1840 අංක 12 දරණ පනතෙහි බලහත්කාරයෙන් ඇතුල්වීම වැලැක්වීම (To Prevent Encrochments upon Crown Lands) යන කොටස අවලංගු කළේය. එමෙන්ම එහි 8වන වගන්තියේ සඳහන් කොට ඇති වසර 30ක අඛණ්ඩව භුක්ති විඳි කාලය වෙනුවට එය වසර 5 දක්වා අඩු කරන ලදී.

## නිගමනය

බ්‍රිතාන්‍ය පාලකයන් බලාපොරොත්තු වූ අරමුණ කරා ළඟා වීමට අවශ්‍ය ආකාරයට 1840 අංක 12 දරණ ඉඩම් ආඥා පනත සකස් කර ඇති බව මේ මගින් මනාව පැහැදිලි වේ. මෙතෙක් කලක් සාම්ප්‍රදායික ගොවිතැන් කටයුතුවල නියළි සිටි ගොවීහු තමන්ගේ වගා කටයුතු සාර්ථක කර ගැනීමට උත්සාහ කළා මිස ඉඩමේ පුද්ගලික අයිතිය පිළිබඳ කිසිදු තැකීමක් නොකළහ. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ගම් පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව මතු වූ අවස්ථාවලදී ඒ ඒ පුද්ගලයා විසින් තම තමන්ට පහසු පරිදි ඉඩම් එළිපෙහෙළි කර ගෙන ඒවා වගාකොට තම ජීවනෝපාය සකසා ගන්නා ලදී. එනමුත් එහි අයිතිය නීත්‍යානුකූල ලියවිලි මගින් තහවුරු කරන ලෙස බ්‍රිතාන්‍යයන් දැනුම් දුන් විට එසේ ඉදිරිපත් කිරීමට ලියවිලි ඔවුන් සතු නොවීය. නිදහසේ ඉඩම් අත්පත් කොට ගෙන වගා කිරීමට හුරු වී සිටි ජන කොටසකට මෙලෙස එක්වරම තම ඉඩමේ අයිතිය ඔප්පු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට සිදුවීම හේතු කොට ගෙන එතෙක් වගා කළ ඉඩම් කැබැල්ල පවා තමන්ට අහිමිවීමෙන් ඔවුහු ඉතා අසරණ තත්වයකට පත් වූහ. එපමණක් නොව වසර ගණනාවක් තිස්සේ තමන් වගා කටයුතු කරගෙන ආ එම ඉඩම රජයට අයිතිවීමත් සමග ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග ඇහිරිණි. එමෙන්ම දේශීය

ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ජනතාවගේ කෘෂිකාර්මික ජීවිතයේ එක් අංශයක් වූ පශු පාලන කටයුතු සඳහා භාවිතා කිරීමට වෙන් වූ නිදහස් ඉඩම් පැවතියද මෙම නව ප්‍රතිපත්තිය තුළින් ඒවා අහිමි විය. ඒ හේතුවෙන් සතුන්ට තණ කැවීම පවා ප්‍රශ්නයක් වී දේශීය ජනතාව ආර්ථික වශයෙන් දරිද්‍රතාවයකට පත් වූහ. තවද තමන්ගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා එනම් දර ලබා ගැනීම, ආහාර සඳහා අවශ්‍ය නොයෙක් ගෙඩි වර්ග, අල වර්ග, පලා වර්ග ලබා ගැනීම මෙන්ම ඖෂධ වර්ග ලබා ගැනීමද දේශීය ජනතාවට ප්‍රශ්නයක් විය. බ්‍රිතාන්‍යයන් පවා මවිතයට පත් වූ දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම මෙරට පැවතුණි. ඒ සඳහා අවශ්‍ය ඖෂධ ලබා ගත්තේද මෙම නිදහස් කැලෑවෙනි. මේ අන්දමට ගොවීන්ට අවශ්‍ය කැලෑ, හේන් සහ තණ බිම් අහිමි වූවා පමණක් නොව ඔවුන්ට ඉතිරි වූ ඉඩම් ස්වල්පයට පවා ජල සම්පාදන පහසුකම් නැතිව ගියේ වතු වගාව සඳහා විශාල අක්කර ගණන් කැලෑ කැපීම හේතුවෙන් ගංගා ඇළ දොළ දිය උල්පත් සිඳී යාමත්, පස් සේදීයාම හා වැව් ගොඩවීමත් නිසාය. මෙලෙසින් සිය ආදායම් මාර්ග සියල්ලම අහිමි වූ ගොවි ජනතාව තමන් සතුව පැවති ඉඩම් කැබැල්ල පවා විකිණීමට පෙළඹුණහ.

බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් 1840 අංක 12 දරණ ඉඩම් පනත මගින් ඉඩම් මුදලට විකිණීමේ මූලික අවස්ථාව ආරම්භ වූ අතර අවශ්‍ය පුද්ගලයකුට තමන් කැමති ප්‍රමාණයකට ඉඩම් ලබා ගැනීමටද හැකියාව තිබිණි. නමුත් මේ තත්වය තුළ වැඩි වන ඉල්ලුමට සරිලන ලෙස ඉඩම් ලබා දීමේ ගැටලුවට මුහුණ දීමට රජයට සිදු විය. විදේශ ආයෝජනය දිරිමත් කිරීමටත්, වතු වගාවෙන් උපරිම ලාභ ලබා ගැනීමටත් රජය වැඩි වැඩියෙන් ඉඩම් විකිණීමට පෙළඹුණි. කෙසේ වුවද ඉඩම් මිලදී ගැනීමට තරම් මූල ධනයක් ඇති පිරිස් දේශීය ජනතාව අතර නොවීය. ඉඩම් කච්චේරි පවත්වා විශාල ඉඩම් කට්ටි වෙන්දේසියේ විකිණීම සිදු කෙරිණ. මේ තත්වය යටතේ සුළු මුදලක් අත ඇති සුළුතර දේශීය පිරිසක් සිටියද ඒ අයට මුදල් වැඩිපුර ඇති අය සමග ලන්සු තැබීමට නොහැකි විය.

එමෙන්ම බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමය හෝ භුක්ති ක්‍රමය පිළිබඳ මනා අවබෝධයක්ද දේශීය සුළු ගොවීන්ට නොතිබිණ. එපමණක් නොව මුදල් තිබූ දේශීය ප්‍රභූවරුන්ට වුවද මෙම

ව්‍යාකූල ක්‍රමය යටතේ විශාල ඉඩම් කට්ටියක් මිළදී ගැනීමේ හැකියාවක් නොතිබිණි. මෙබඳු තත්වයක් තුළ සිදු වූ අනිවාර්ය ක්‍රියාදාමය නම් සුළු ගොවියා ඉතාමත් අසරණ තත්වයට පත් වෙද්දී මිල මුදල් හිමි එමෙන්ම බ්‍රිතාන්‍ය ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයක් ඇති යුරෝපීය ව්‍යාපාරිකයෝ මෙරට ඉඩම් විශාල වශයෙන් මිලදී ගැනීමය. කෙසේ වුවද මෙරට ඉඩම් වගා කළ පුද්ගලයෝ සියලු දෙනාම තමන් මෙතෙක් භුක්ති විඳි ඉඩම රජයට අත්පත් කර ගැනීමට ඉඩදී නිහඬ නොවූහ. මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇති ඉඩම් අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් ඒ බව පැහැදිලි වේ. මෙම අයදුම්පත් අතර බහුතරයක් ඉංග්‍රීසි ජාතිකයන්ට අයත් වුවද ඒ අතර සිංහල හා ද්‍රවිඩ නම් සඳහන් අයදුම්පත්ද දක්නට ඇත.

## ආශ්‍රිත මූලාශ්‍රය


අබයසිංහ, දේවරාජ සෝමරත්න 1977, ***උඩරට රාජධානිය,*** 1470-1818 ලේක්හවුස් : කොළඹ

අසෝකා, බණ්ඩාරගේ. 2005 ***ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය,*** ස්ටැම්ෆර් ලේක් ප්‍රකාශනඃ පන්නිපිටිය.

වැන්ඩන්ඩ්‍රිසන්, එ.එච්. 1963, ***ශ්‍රීලංකාවේ කෝපි වගා කිරීමේ ඉතිහාසය, නූතන යුගය.*** තිසරප්‍රකාශකයෝඃ දෙහිවල.

විමලානන්ද, තෙන්නකෝන්. 1963, ***උඩරට මහ කැරැල්ල,*** ගුණසේන සහ සමාගම, කොළඹ

සෝමරත්න, පී.පී.වී. (සංස්.) 1991, ***ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය,*** කොළඹ විශ්වවිද්‍යාලය : කොළඹ.

ඩේරික්, ලෙවිස්. 1923, ***ශ්‍රී ලංකාවේ හැට හතර වසරක්,*** (පරි.) වර්ථක. පරාක්‍රම. එස්. විජේවර්ධන. පියසිරි ප්‍රින්ටර්ස්, නුගේගොඩ, 129-132 පිටු.

A.C.L.Ammeer Ali ***"Changing Conditions and Peß isting Problems in the Peasant Sector under British Rule in the Period 1833- 1893"*** Ceylon Studies Seminar: No 3a 1970 | 72 Series

G.C. Mendis, 1956, ***the Colebrooke Cameron Papers Vol.*** I, London.

***Land Aplication Register,*** From 1904 To 1926. Land Register Office Kandy.

***Land Aplication Register,*** From 1904 To 1926. Land Register Office Kandy. Books 23-30.

Michael Roberts ***"some Comments on Ameer Ali's Paper"*** Ceylon Studies Seminar: No 3b 1970 | 72 Series.

Ordinance ***No12 of 1840, To Prevent Encrochments upon Crown Lands,*** 1938 the Legislative Enacments of Ceylon, Vol, I. Government Printer: Colombo.

Proclamation of 21st May, 1822. 1938 ***Legislative Enacments of Ceylon*** Vol.II, Government Printer: Colombo.

Proclamation of 18th September, 1819.1938 ***Legislative Enacments of Ceylon,*** Vol.II Government Printer: Colombo.